“සෑම රාත්රියකම, රාත්රියේ තුනෙන් අවසාන කොටස පවතින විට, අපගේ පරමාධිපතියාණන් මෙලොව අහසට පහළ වී

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. “සෑම රාත්රියකම, රාත්රියේ තුනෙන් අවසාන කොටස පවතින විට, අපගේ පරමාධිපතියාණන් මෙලොව අහසට පහළ වී ‘කවරෙකු මා අමතන්නේ ද? මම ඔහුට පිළිතුරු දෙමි. කවරෙකු මගෙන් විමසන්නේ ද? මම ඔහුට පිරිනමමි. කවරෙකු මගෙන් සමාව අයදින්නේ ද? මම ඔහුට සමාව දෙමි.” යැයි පවසයි."
[صحيح] [متفق عليه]

සෑම රාත්රියකම, රාත්රියේ කොටස් තුනෙන් අවසන් කොටස පවතින විට, උත්තරීතර අල්ලාහ් මෙලොව අහසට පහළ වන බවත්, ඔහුගේ ගැත්තන් ඔහුව ඇමතීම ගැන ඔහු සතුටු වන බවත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ පැහැදිලි කළහ. එසේම ඔහුව අමතන්නන් හට ඔහු පිළිතුරු දෙන්නාය. ඔවුන් කැමති දෑ ඔහුගෙන් ඉල්ලීමට ඔහු ඔවුන්ව පොළඹවයි. ඔහුගෙන් ඉල්ලන අයට ඔහු පිරිනමන්නාය. ඔවුන් පසුතැවිලි වී පාපක්ෂමාව පතන්නේ නම්, එසේ පාපක්ෂමාව පතන මුඃමින්වරුන්ට ඔහු සමාව දෙන්නාය.

http://sunnah.global/hadeeth/si/show/10412